// logo

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1817/34 - 2013 ජූලි 03 වැනි සිකුරාදා - 2013.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/10/55/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මාකොල, මාකොල දකුණ, අංක 453/5හි පදිංචි ජේ. එම්. එම්. එස්. ජයසුන්දර මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, 12 වැනි මහල, ප්‍රධාන කාර්යාලය හි පිහිටි මහජන බැංකුව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.05.30 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. චාන්දනී අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*මගේ අංකය :* IR/10/55/2010.

**කාර්මික අධිකරණයේ දී**

ජේ. එම්. එම්. එස්. ජයසුන්දර මයා,
අංක 453/5, මාකොල දකුණ,
මාකොල.

පළමු පාර්ශවය

නඩු අංකය : ඒ 3455 සහ

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
12 වැනි මහල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02

දෙවන පාර්ශවය

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධව

**ප්‍රදානය**

වැඩ බලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39, (1968 අංක 37 දරන කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2012.06.06 දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත :-

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

(1) මහජන බැංකුවේ සේවය කරන ලද ජේ. එම්. එම්. එස්. ජයසුන්දර මහතාට II වැනි පන්තිය සඳහා 1989 දී ලැබිය

යුතු උසස් වීම 1996 දක්වා ප්‍රමාද වීමෙන් I වැනි ශ්‍රේණියට පත්වීමේ ජ්‍යෙෂ්ඨතාව අඩුවීම හා I වැනි ශ්‍රේණියට ලකුණු ලබා දීමේ දී එම ලකුණු සාවද්‍ය ලෙස එකතු කිරීමෙන් ඔහුට අදාල උසස්වීම නොලැබීයාම යුක්ති සහගත ද යන්න හා ඒසේ නොවන්නේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ. ;

(2) තවද, පැමිණිලිකරු සම්බන්ධයෙන් පැවැත් වූ විනය පරීක්ෂණයේදී විනය නීති පටිපාටි අනුගමනය නොකිරීම හා මානම හිමිකම් නිර්දේශය අනුව හෝ නැවත පරීක්ෂණයක් නොකිරීම හරහා ඔහුට අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ වන්නේ නම් ඔහුට කුමන සහනයන් හිමි විය යුතු ද යන්න පිළිබඳව වේ. ;

(3) 2003.02.27 වැනි දින දක්වා සේවය දීර්ඝ කර තිබියදී, 2002.12.18 වැනි දින සිට විශ්‍රාම යැවීම හරහා පැමිණිලිකරුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ නම් කුමන සහනයන් ඔහුට ලැබිය යුතුව යන්න පිළිබඳව වේ ;

*පෙනී සිටීම*

ඉල්ලුම්කරු වෙනුවෙන් ඩී. ලීලානන්ද මහතා පෙනි සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් මහජන බැංකුවේ නීති නිලධාරී ජනත් ජයවර්ධන මහතා සමඟ නීතිඥ මනෝලි ජිනදාස මිය පෙනී සිටින ලදී.

මෙම නඩුව 2012.07.12 වැනි දින කැඳවූ දිනයේ දී වගඋත්තරකරු සිය ප්‍රකාශය ගොනු කිරීම සඳහා සති තුනක කාලයක් ඉල්ලීමෙන් අනතුරුව අදාළ ප්‍රකාශය ගොනු කරන ලදී. ඉහත ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව වගඋත්තරකරු විරෝධතාවයක් මතුකරමින් මෙම කාර්මික ආරවුල කලාවරෝධයට ලක්ව ඇති බවද එසේම ඉල්ලුම්කරු විශ්‍රාම යවා ඇති හෙයින් ඉහත ආරවුල කාර්මික ආරවුලක් සේ සැලකිය නොහැකි බවටද වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවය හා ඉල්ලුම්කාර පාර්ශවය ඊට අදාළ ලිඛිත සැල කිරීම් ඉදිරිපත් කිරීමට දින ලබා දෙන ලදී. ඉහත ආරවුල සමථයකට පත් කර ගැනීමට කටයුතු කර ගැනීමට හැකියාවත් ඇතිනම් ඒ පිළිබඳව සැලකිල්ලට යොමු කරන ලෙස දෙපාර්ශවයට දැනුම් දීම මත ඊට අදාලව පියවර ගැනීමට දෙපාර්ශවය කැමැත්ත පළ කරන ලදී.

සමථය පිළිබඳව කටයුතු කිරීමට දින ලබා ගැනීමෙන් අනතුරුව ඊට අදාල සමථය පිළිබඳව කොන්දේසි 2013.03.28 වැනි දින බේරුම්කරණයට වාර්ථා කරන ලදී. ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලුම් වලට අදාල පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් රු. 2,50,000 මුදලක් බැංකුවට ගෙවීමටත්, එකී මුදල ලබා ගෙන සමථයට පත්වීමට ඉල්ලුම්කරු එකඟ බවත් බේරුම්කරණයට 2013.03.28 වැනි දැනුම් දෙන ලදී. අදාල ගෙවීම සඳහා 2013.05.03 වැනි දින මෙම නඩුව නැවත කැඳවන ලදී. වගඋත්තරකාර බැංකුව රුපියල් දෙලක්ෂ පනස්දහසකට අදාළව අංක 220275 සහ 2013.04.26 දින දරන චෙක්පත විවෘත අධිකරණයේදී ඉල්ලුම්කරුට භාර දෙන ලදී. ඒ අනුව ඉහත ආරවුල සමථයකට පත් කළ අතර එය සාධාරණ හා යුක්ති සහගත ප්‍රධානයක් බව මම නිගමනය කරමි. ඒ අනුව මෙම ආරවුල සමථයට පත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2013 මැයි මස 30 වැනි දින.

07 - 509

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.